ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
Regional Development Bank

2025 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2025 වර්ෂය සඳහා භාණ්ඩ, වැඩ හා සේවා සම්පාදනය සඳහා ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පිළිගත් සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් හා උපදේශක සේවා සපයන්නන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

කාණ්ඩ

01. යන්ත්‍ර උපකරණ, කාර්යාලීය උපකරණ හා සවිකිරීම්

1.1 වායුසමන යන්ත්‍ර
1.2 CCTV පද්ධති
1.3 ආරක්ෂක සංඥ පද්ධති
1.4 Duplicating යන්ත්‍ර හා Paper Shredding යන්ත්‍ර
1.5 Densi Meter හා උකස් තරාදි
1.6 මුදල් නෝට්ටු ගණන යන්ත්‍ර
1.7 CCTV කැමරා හා ඒ සඳහා අවශ්‍ය අනෙක් උපකරණ
1.8 පාස් පොත් (Pass Book) මුද්‍රණ යන්ත්‍ර හා අනෙකුත් මුද්‍රණ යන්ත්‍ර (Dot Matrix ආදිය)

02. අලෙවිකරණ කටයුතු

2.1 නාම පුවරු මොනපෝල් හා පයිලෝන් (Monopol / Pylon)
2.2 ගාබා සන්නාමකරණ කටයුතු (Branding)
2.3 Digital flex සහ Sticker මුද්‍රණ කටයුතු (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

03. මුද්‍රණ කටයුතු

3.1 සියලුම වර්ගයේ ලිපි කවර
3.2 සියලුම වර්ගයේ ආකෘති පත්‍ර, රෙජිස්ටර් වර්ග හා පොත් පත්
3.3 සියලුම වර්ගයේ ප්‍රචාරක පත්‍රිකා
3.4 පාස් පොත්
3.5 ආරක්ෂිත මුද්‍රණ කටයුතු (ස්ථිර තැන්පත් සහතික හා PIN Mailer)
3.6 පරිගණක පත්‍රිකා මුද්‍රණය (Continue Sheet)

04. මිශ්‍ර අයිතම (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

4.1 සියලුම ලිපි ද්‍රව්‍ය හා සුළුඋපකරණ
4.2 මුද්‍රණ කාට්‍රිජ් ඊබන් හා ටෝනර්
4.3 පරිගණක ලිපි ද්‍රව්‍ය (Black light අත්සන් පත්‍රිකා සහ කාබනයිස් හා තර්මල් පත්‍රිකා (ATM, CDM, Plam top))
4.4 ප්ලාස්ටික් කවර (පාස් පොත් කවර/ ATM කාඩ්පත් කවර)

05. ඉදිකිරීම් හා කොන්ත්‍රාත්

5.1 ගොඩකැගිලි
5.2 ඇලුමිනියම් වැඩ හා නිමාවන්
5.3 ගාබා අභ්‍යන්තර සැකසුම්
5.4 ජාල රැහැන් ගත කිරීම (Networking)
5.5 විදුලි රැහැන් ගත කිරීම (Electrical Wiring)

06. වෙනත් සේවා (දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් මිලදී ගැනීම)

6.1 මෝටර් රථ වාහන අලුත්වැඩියාව
6.1.1 යාන්ත්‍රික අලුත්වැඩියාව
6.1.2 විදුලිමය අලුත්වැඩියාව
6.1.3 ටින්කරින් හා ස්ප්‍රේ පේන්ටින්
6.1.4 මෝටර් රථවාහන වායුසමන යන්ත්‍ර අලුත්වැඩියාව (Auto AC)
6.2 වාහන නඩත්තු හා සේවා කිරීම්
6.3 වායුසමන යන්ත්‍ර නඩත්තු අලුත්වැඩියාව හා සේවා (Maintenance, Repair & Services)
6.4 CCTV නඩත්තු අලුත්වැඩියාව හා සේවා (Maintenance, Repair & Services)
6.5 ආරක්ෂක සංඥ පද්ධති නඩත්තු අලුත්වැඩියාව හා සේවා (Maintenance, Repair & Services)
6.6 නාම පුවරු මොනපෝල් නඩත්තු අලුත්වැඩියාව හා සේවා (Maintenance, Repair & Services)
6.7 විදුලි උත්පාදක යන්ත්‍ර නඩත්තු අලුත්වැඩියාව හා සේවා (Maintenance, Repair & Services)
6.8 පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, UPS යන්ත්‍ර හා අනෙකුත් පරිගණක උපාංග අලුත්වැඩියාව.

07. ගෘහ භාණ්ඩ

7.1 සියලුම වර්ගයේ කබඩ්
7.2 කාර්යාල සුටු
7.3 සෝෆා
7.4 කාර්යාල මේස
7.5 සේප්පු වර්ග

08 තෑගි භාණ්ඩ

8.1 කුඩ
8.2 පාසල් බැග් Travelling බැග්
8.3 කැට
8.4 පාපැදි
8.5 පොත් කට්ටල / සන්නාම කරන ලද පැන්
8.6 අනෙකුත් සියලුම වර්ගයේ තෑගි භාණ්ඩ

09 වාහන සඳහා ටයර් ටියුබ් හා බැටරි

කොන්දේසි හා නියමයන්

සියලුම අයදුම්කරුවන් පහත සඳහන් කොන්දේසි සපුරාලිය යුතුය.

1. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ව්‍යාපාරිකයන් / කොන්ත්‍රාත්කරුවන් විය යුතු අතර, ව්‍යාපාරික ලිපිනයේ දුරකථන ෆැක්ස් සහ ඊමේල් පහසුකම් තිබීම වඩාත් යෝග්‍ය වේ. (ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
2. විදුලි රැහැන් ගත කිරීම සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන කොන්ත්‍රාත්කරුවන් (Electrical Wiring) (සඳහා CIDA ආයතනයේ (EM) යටතේ ලියාපදිංචිය තිබිය යුතුය.
3. ඉහත කාණ්ඩ අංක 05 යටතේ (5.1, 5.2, 5.3) ඉදිකිරීම් හා කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන කොන්ත්‍රාත්කරුවන් පහත කිර්ණායක සපුරාලිය යුතුය.
   3.1 ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී තිබිය යුතුය. (ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය).
   3.2 CIDA ලියාපදිංචිය තිබිය යුතුය (ලියාපදිංචි සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතුය).
   3.3 අදාළ ක්ෂේත්‍රය සඳහා අවම වසර 05 පළපුරුද්දක් තිබිය යුතුය (ඒ පිළිබඳ තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන අමුණා තිබිය යුතුය).
   3.4 පසුගිය වසර 02 තුළදී සාමාන්‍ය වාර්ෂික කොන්ත්‍රාත් වටිනාකම රු.මි. 15ට වැඩි විය යුතුය (ඒ පිළිබඳ තහවුරු කිරීම සඳහා වැඩ නිම කිරීමේ සහතිකය අමුණා තිබිය යුතුය.) (2022 / 2023).
4. අනෙකුත් කාණ්ඩ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන අයදුම්කරුවන් රජයේ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල, බැංකු හා පිළිගත් පෞද්ගලික ව්‍යාපාරික ආයතනවලින් පසුගිය වසර 03 දී මෙබඳු ඇණවුම් ලබා සතුටුදායක සැපයුම් සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
5. අයිතම අංක 6.3, 6.4, 6.5 හා 6.7 සඳහා ලියාපදිංචිවීම සඳහා අවම වසර 05 පළපුරුද්දක් තිබිය යුතුය (ඒ පිළිබඳ තහවුරු කිරීම සඳහා අදාළ ලේඛන අමුණා තිබිය යුතුය).
6. යන්ත්‍ර හා උපකරණ වැනි අලුත්වැඩියාවන් සහිත අයිතමයන් සැපයීමට බලාපොරොත්තු වන සැපයුම්කරුවන් අදාළ අලුත්වැඩියා කිරීමට අවශ්‍ය අවස්ථාවලදී කර්මාන්තශාලා පහසුකම් තමන් සතු අය විය යුතුය.
7. අයදුම්පත් **අපගේ www.rdb.lk වෙබ් අඩවිය තුළින් බාගත කර** ගැනීමේ පහසුකම අයදුම්කරුවන් වෙත සලසා ඇත. හඳුන්වා දී ඇති මෙම ආකෘති පත්‍රය මගින් පමණක් අයදුම් කළ යුතු අතර, එසේ නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.
8. එක් කාණ්ඩයක් යටතේ ඇති අනු කාණ්ඩ සඳහා එක් අයදුම්පතක් මගින් අයදුම් කළ හැකි අතර **සෑම ප්‍රධාන කාණ්ඩයක් සඳහාම වෙනවෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා ආපසු නොගෙවන රු.5,000.00 බැගින් (ප්‍රධාන කාණ්ඩ 09 සඳහා වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතුය) ලියාපදිංචි ගාස්තුවක් අයදුම්පත් භාර දීමේදී මුදලින් ගෙවිය යුතුය.**
9. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.11.26 දින හෝ එදිනට පෙර සහකාර සාමාන්‍යාධිකාරී –ඉංජිනේරු හා පරිපාලන, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, නො : 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය, වෙත හෝ මධ්‍යම, ඌව, සබරගමුව, නැගෙනහිර, වයඹ, උතුරු මැද, බස්නාහිර හා දකුණ යන පළාත් කාර්යාල වෙත ගෙනවිත් භාර දිය යුතුය. (අපගේ www.rdb.lk වෙබ් අඩවියේ අදාළ පළාත් කාර්යාල වල ලිපිනයන් සඳහන්ව ඇත)
10. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2025 සහ කාණ්ඩ අංකයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.
11. ව්‍යාපාර ලියාපදිංචි සහතිකය, මෙබඳු ඇනවුම් ලබා සතුටුදායක ලෙස සැපයුම් හා සේවා නිම කර ඇති බවට ලිඛිත සාක්ෂි (මිලදී ගැනීමේ ඇනවුම් හෝ කොන්ත්‍රාත් ගිවිසුම් පිටපත්) පිටපත් හා ඉල්ලා ඇති අනෙකුත් ලේඛණ අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමක් නොමැතිව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්කරුවන් සැපයුම්කරුවන් ලෙස ලියාපදිංචි නොකෙරෙනු ඇත.
12. අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හෝ කලත්‍රයා හෝ ඔවුන්ගේ දරුවන් අයදුම්කරු / අයිතිකරුවන් / හවුල්කරුවන් හෝ අධ්‍යක්ෂකවරුන් වන ආයතන සැපයුම්කවන් ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් නොලබයි.
13. අවස්ථා තුනකදී ලංසු සඳහා ඉදිරිපත් නොවන්නේනම් හෝ නියමිත වේලාවට භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන හෝ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ, සේවා, අලුත්වැඩියා සහ නඩත්තු සපයන අයගේ නම් සැපයුම්කරුවන් ලියාපදිංචියෙන් ඉවත් කිරීම බැංකුවේ අභිමතය පරිදි සිදුකරනු ලැබේ.
14. එක් එක් අයදුම්පත් ඇගයීමට ලක් කරන අතර, බැංකුව තීරණය කරන පරිදි සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයිතිය බැංකුව සතු වේ. සුදුසුකම් සම්පූර්ණ නොකළ අයදුම්කරුවන් වෙත ඒ බව ලිඛිතව දන්වනු ලබයි.

වැඩි විස්තර අවශ්‍යනම් කළමනාකරු – ප්‍රසම්පාදන වෙත අංක 011 2035454 යන දුරකථන අංකයට අමතා එම තොරතුරු ලබා ගත හැකිය.

සහකාර සාමාන්‍යාධිකාරී - ඉංජිනේරු හා පරිපාලන,
නො. 933, නුවර පාර, වෙදමුල්ල, කැලණිය.
011 2035454
ෆැක්ස් 011 2906883
2024-10-25